# 1.6 භාෂණ සිංහල සහ දෙමළෙහි හඬ අනුකරණාත්මක වචන පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩයනා කුමාරි ඉද්දමල්ගොඩ
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

**1.0 අරමුණ**

භාෂණ සිංහලයෙහි සහ භාෂණ දෙමළෙහි ඇති හඬ අනුකරණාත්මක වචන පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් කිරීම මෙහි අරමුණයි.මෙම අධ්‍යයනයෙහි දී භාෂණ සිංහලය සමග සැසඳීමේ දි භාෂණ දෙමළට ආවේණික ශබ්ද රටා කවරේදැයි සොයා බැලීමත්, දෙමළ භාෂාවෙහි සාමාන්‍ය ශබ්ද රටාවෙන් හඬ අනුකරණාත්මක වචනවල ශබ්ද රටාව වෙනස් වන ආකාරයත් මෙහි දී සලකා බැලේ. මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනුනේ කොළඹ ආශ්‍රිත භාෂණ සිංහලයෙහිත්, උතුරු ප්‍රදේශය ආශ්‍රිත භාෂණ දෙමළෙහිත් භාවිත වන හඬ අනුකරණාත්මක වචනයි.

**2.0 හඬ අනුකරණාත්මක වචන**

සෑම ජීවමාන භාෂාවකම දක්නට ලැබෙන සුවිශේෂ වචන ප්‍රවර්ගයකි. කිසියම් අදහසක් වඩා තීව්‍ර ලෙස ප්‍රකාශ කිරීම සඳහා මෙම වචන භාවිත කෙරේ. කිසියම් භාෂාවක යෙදෙන හඬ අනුකරණාත්මක වචන පහතාකාරයට වර්ගීකරණය කළ හැකියි.

I මිනිසුන්ගේ විවිධ මනෝභාවයන් හා සම්බන්ධ හඬ අනුකරණාත්මක වචන
II විවිධ මිනිස් ක්‍රියාකාරකම් හා බැඳුණු හඬ අනුකරණාත්මක වචන
III යම් යම් දේවල ස්වභාවය පෙන්නුම් කරන හඬ අනුකරණාත්මක වචන
IV සත්වයන්ගේ හඬ අනුකරණාත්මක වචන

සත්වයන්ගේ හඬට සමාන හඬ ඇතුළත් හඬ අනුකරණාත්මක වචන හැර සෙසු හඬ අනුකරණාත්මක වචන මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනිණි.

භාෂණ සිංහල හඬ අනුකරණාත්මක වචන සමග සැසඳීමේ දී භාෂණ දෙමළෙහි **h** ශබ්දයෙන් අවසන් වන හඬ අනුකරණාත්මක වචන දැකිය නොහැකියි.

භාෂණ සිංහලයෙහි කිසියම් පුද්ගලයකුගේ අවධානය යොමු කර ගැනීම සඳහා **e:i, o:i** වැනි වචන භාවිත වේ. භාෂණ දෙමළෙහි ද **e:i, o:i** යන රූප දැකිය හැකියි. **e:i** යන රූපයට පර්යායව **injarunko:**, **injai** යන යෙදීම් භාෂණ දෙමළෙහි දැකිය හැකියි. එහෙත් දෙමළ භාෂාවෙහි **o:i** රූපය පිළිතුරු දීමේ දීද භාවිත කෙරේ. එමෙන්ම තමාට දුරින් සිටින මව හෝ පියා ඇමතීමේ දී **ammo:i, appo:i** යනුවෙන් ඇමතීම භාෂණ දෙමළෙහි දැකිය හැකි විශේෂත්වයකි.

දෙමළ භාෂාවේ සාමාන්‍ය ශබ්ද රටාවෙහි වචනාන්තයේ යෙදෙන්නේ **c, m, n, |, l, L, r, N** සහ **j** යන ශබ්ද ය. එහෙත් භාෂණ දෙමළ හඬ අනුකරණාත්මක වචනවල **p,N, k,T, s** යන ශබ්ද වචනාන්තයෙහි යෙදේ. **top e |Du**, **is e |Du , Dak e |Du** යන වචන ඒ සඳහා නිදසුන් වේ.

භාෂණ දෙමළ සාමාන්‍ය ශබ්ද රටාවෙහි ÷ ශබ්දය යෙදෙන්නේ ස්වර ශබ්ද දෙකක් අතර සහ r, l යන ශබ්දවලට පසුවයි. එහෙත් ඇතැම් හඬ අනුකරණාත්මක වචනවල ÷ ශබ්දය වචන මුල යෙදීම දැකිය හැකියි. ලිපට පිඹින ශබ්දය හැඟවීම සඳහා භාෂණ සිංහලයෙහි **pu: pu: ga:n↔wa** යන්නට භාෂණ දෙමළෙහි ÷u: ÷u: **eNDu** යන වචනය යෙදෙයි.

මේ අනුව සැලකීමේ දී එකම රටක් තුළ පවත්නා භාෂා දෙකක් වුවත් එකී භාෂා සංස්ථිතීන්ට අනුව ඒවායෙහි හඬ අනුකරණාත්මක වචන එකිනෙකට වෙනස් විය හැකියි.